# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,879/14 — 1969 නොවැම්බර් 28 වැනි සිකුරාදා — 1969.11.28

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස — ඉඩම්

(වෙන වෙනම ගොනුකර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

**38 වෙනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව**

1969 අංක 389 දරණ ආඥාව

යොමු අංකය : ජේ. 69/70 ඊ 61
කිච්. කේ/156

1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වෙනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, පහත සඳහන් උපලේඛනයේ I වෙනි තීරයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත් එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියාට, එම උපලේඛනයේ II වෙනි තීරයේ අනුරූප සටහනේ දක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

සී. පී. ද සිල්වා,
ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

කොළඹ, 1969 නොවැම්බර් මස 25 වෙනි දින දීය.

## උපලේඛනය

| I<br>ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා | II<br>ඉඩමේ විස්තරය |
|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ අතිරේක දිසාපති ... ... | කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ප්‍රාදේශීය ආදායම් නිළධාරි කොට්ඨාශයේ, තිඹිරිගස්යාය ග්‍රාම සේවක කොට්ඨාශයේ, කොළඹ නගර සභා සීමාව තුළ, අංක 39 දරණ මිලාගිරිය කොට්ඨාශයේ, ගාලු පාරේ පිහිටි වරිපනම් අංක 291 සහ 295 න් කොටසක් වූ පහත සඳහන් මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර 0, රූඩ් 1, පර් : 36 ක්වූ ඉඩම් කොටස :—<br><br>උතුරට —ඩික්මන් පාර,<br>නැගෙනහිරට —ගාලු පාරේ වරිපනම් අංක 295 සාන්ත පාවුළු මිලාගිරිය බාලිකා පාසලට අයත් ඉඩම,<br>දකුණට —ගාලු පාරේ වරිපනම් අංක 295 න් කොටසක් වන මිලාගිරිය සාන්ත පාවුළු පල්ලිය සතු ඉඩම,<br>බටහිරට —ගාලු පාර. |

11-819


ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණයකි

1 A—ජේ 8765—5,575 (69/11)



ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව